2019. 07. 17.

දිවයින

# රජයේ මුළු ණය 2018 දී සියයට හයකින් ඉහළට

ශ්‍යාම් නුවන් ගනේවත්ත

රජයේ මුළු ණය ප්‍රමාණය ගිය වසරේදී (2018) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 04 - පිටුවට

## රජයේ මුළු...

මෙසේ ගිය වසරේදී රාජ්‍ය ණය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ අනෙකුත් ප්‍රධාන ජාත්‍යන්තර මුදල් ඒකකවලට සාපේක්ෂව රුපියල පිරිහීම සහ නාමික වශයෙන් දළ දේශීය නිෂ්පාදිතය අඩු මට්ටමක පැවතීමයි.

මුළු රාජ්‍ය ණය නියෝජනය කරන දේශීය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 41.6 දක්වා ප්‍රතිශතාංක 0.1 කින් අඩු වී තිබුණත් 2018 වසර අවසානය වන විට දී විදේශ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 41.2 දක්වා ප්‍රතිශතාංක 6.0 කින් සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ. එමෙන්ම දේශීය ණය සමස්ත නොපියවූ ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසර අවසානය වන විට පැවැති සියයට 54.2ක ප්‍රමාණය 2018 වසර අවසානය වන විට සියයට 50.2 දක්වා අඩු වී ඇති බව ද මුදල් අමාත්‍යාංශ වාර්ෂික වාර්තාවේ සඳහන් වේ.

ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් එකතුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ දී පැවැති සියයට 11.9 සිට 2018 වසරේ දී සියයට 14.5 දක්වා ප්‍රතිශතාංක 2.6 කින් වැඩි විය. ණය පොලී හා ණය වාරික ගෙවීම් පිළිවෙළින් සියයට 15.9කින් සහ සියයට 42.5කින් වර්ධනය වීමත් සමග නාමික වශයෙන් 2018 වසරේ දී සමස්ත ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් සියයට 30.3 කින් වැඩි විය. දේශීය ණය මූලාග්‍ර මත ණය ආපසු ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.4 දක්වා වැඩි වූ අතර විදේශීය ණය මූලාග්‍ර මත ණය ආපසු ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ලෙස සියයට 2.2 ක් විය. 2018 වසරේ දී දේශීය ණය මත පොලී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.4 දක්වා වැඩි වී ඇති අතර විදේශීය ණය මත පොලී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 1.5 ක් දක්වා වැඩි වූ බවද එහි සඳහන්ය.